පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2017

ශ්‍රේණිය 12

## විෂය බෞද්ධ ශිෂ්ටාචාරය -I

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................

.................................................... කාලය : පැය 2 යි.

Education NCP - www.edncp.lk

❖ **අංක 01 සිට 50 දක්වා ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරු සපයන්න.නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සමාජය හා සමාජ සංස්ථා ඊශ්වර නිර්මාණයක් බව ඉගැන්වූයේ,

i) ආජීවකයන් විසින් ය.
ii) ක්ෂත්‍රියයන් විසින් ය.
iii) බමුණන් විසින් ය.
iv) මුනිවරුන් විසින් ය.
v) ජෛනාගමිකයන් විසින් ය.

02. ඒ ඒ වර්ණවලට අයත් කාර්ය නියම කරනු ලබන බ්‍රාහ්මණික ඉගැන්වීම හැඳින්වෙන්නේ ,

i) වර්ණධර්ම නමිනි.
ii) ආශ්‍රමධර්ම නමිනි.
iii) ස්වධර්ම නමිනි
iv) නියාමධර්ම නමිනි.
v) ආපද්ධර්ම නමිනි.

03. බ්‍රාහ්මණ වර්ණ ධර්මයට අනුව දෙවන ස්ථානය හිමි වූයේ ක්ෂත්‍රිය වර්ණයට ය. මනුස්මෘතියේ දැක්වෙන පරිදි ක්ෂත්‍රිය වංශයට අයත් නොවන කාර්යයක් වන්නේ,

i) දන් දීම　　ii) යාග කිරීම　　iii) යාග කරවීම
iv) වේද අධ්‍යයනය　　v) ප්‍රජා පාලනය

04. බ්‍රාහ්මණ ඉගැන්වීම් අතර ස්ව ධර්ම තුළින් ඒ ඒ වර්ණ විසින් ඉටු කළ යුතු කාර්යයන් පෙන්වාදෙන අතර "අඩුපාඩු සහිතව හෝ තම කුලයට අයත් කාර්යයන්වල යෙදීම ස්ව ධර්ම මඟින් අවධාරණය කරයි"මෙසේ සඳහන් වන ඉගැන්වීම ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

i) ජෛන භගවතීයෙහි ය. ii) භගවත් ගීතාවෙහි ය. iii) මනුස්මෘතියෙහි ය.

iv) ඍග් වේදයෙහි ය. v). කෘෂ්ණයජුර් වේදයෙහි ය.

05. බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය වංශික දරුවන් නිසි වයසේදී අනිවාර්යයෙන් අධ්‍යාපනය ලැබිය යුතු ය. එසේ ලැබූ අධ්‍යාපනය අවසානයේ ගුරු පඬුරු පූජා කොට නිවස බලා පිටත්වීමට මත්තෙන්,පැවැත් වූ උත්සවය හැඳින්වෙන්නේ,

i) උපනයන මංගල්‍ය නමින් ය.
ii) සමාවර්තන මංගල්‍ය නමින් ය.
iii) ස්නාතක මංගල්‍ය නමින් ය.
iv) සමුච්චය මංගල්‍ය නමින් ය.
v) අභිෂේක මංගල්‍ය නමින් ය.

06. බෞද්ධ චින්තනය තුළ කාන්තාවට ලැබුණු උසස් ම ආගමික නිදහස වන්නේ පැවිද්දේ දොරටු විවර වීමයි. ඒ සමග ම බුදුසමය භික්ෂු භික්ෂුණී දෙපාර්ශවයට ම සම අගතනතුරු ද පිරිනමන්නට විය, ඒ අතුරින් "දිවැස් ඇති තෙරණියන් අතර අගතනතුර ලැබූ භික්ෂුණිය" වූයේ,

i) උප්පලවණ්ණා තෙරණිය යි.
ii) සකුලා තෙරණිය යි.
iii) ඛේමා තෙරණිය යි.
iv) ධම්මදින්නා තෙරණිය යි.
v) සිගාලමාතා තෙරණිය යි.

07. බුද්ධකාලීන භාරතීය බ්‍රාහ්මණ හා ශ්‍රමණ සංස්කෘතීන් එකිනෙක සැසඳීමේ දී පැහැදිලි වන පරිදි,පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) බ්‍රාහ්මණ සංස්කෘතිය, ගතානුගතික සාම්ප්‍රදායික පිළිවෙත් උසස් කොට සලකනු ලැබූ අතර ශ්‍රමණ සංස්කෘතිය ගතානුගතික පිළිවෙත් වලින් බැහැරව කටයුතු කිරීම අගය කරයි.
ii) බ්‍රාහ්මණ සංස්කෘතිය දේව නිර්මාණවාදය බැහැර කරන අතර ශ්‍රමණ සංස්කෘතිය එය පිළිගනී.
iii) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද කාන්තා නිදහස අගය කරයි.
iv) බ්‍රාහ්මණ සංස්කෘතිය ආශ්‍රම ධර්මයන් අගය කරන අතර ශ්‍රමණ සංස්කෘතිය ද එය පිළිගනී.
v) බ්‍රාහ්මණ සංස්කෘතිය මෙන්ම ශ්‍රමණ සංස්කෘතිය ද මිනිසාගේ ආගමික නිදහස අගය කරයි.

08. බුද්ධකාලීන භාරතයේ විසූ ෂට්ශාස්තෘවරු අතුරෙන් ආජීවක සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකෙනුයේ,

i) පූරණ කස්සප ය. ii) මක්ඛලි ගෝසාල ය. iii) අජිත කේසකම්බලී ය.

iv) සංජය බෙල්ලට්ඨි පුත්ත ය. v) පකුධ කච්චායන ය.

Education NCP - www.edncp.lk

09. බුද්ධකාලීන භාරතයෙහි පැවති සොළොස් මහා ජනපද අතර ප්‍රබල රාජ්‍යයන් හතරක් පැවතියේය. එහිදි ගිජ්ඣකූට, ඉසිගිලි, වේභාර, විපුල්ල හා පාණ්ඩව යන පංචමහා පර්වතයන්ගෙන් ස්වභාවික ලෙසම ආරක්ෂා වූ රාජ්‍ය වූයේ,

i) කෝසල රාජ්‍යය යි. ii) අවන්ති රාජ්‍යය යි. iii) වත්ස රාජ්‍යය යි.

iv) මගධ රාජ්‍යය යි. v) මත්ස්‍ය රාජ්‍යය යි.

10. බුද්ධ කාලීන භාරතයේ විවිධ ජීවනවෘත්තීන් පැවති බවට සාධක හමුවේ. විශේෂයෙන්ම බුද්ධ කාලය වන විට භාරතයේ පැවති අජාසත්ත රජු සඳහන් කළ වෘත්තීන් ගණනාවක් සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ.මෙහි ලා ආර්ථිකයට සේවා සැපයීමෙන් දායක වූ තවත් පිරිසක් ලෙස පංචම කුලයට අයත් පිරිස්දැක්විය හැකිය. ඒ අනුව නේසාද කුලයට අයත් කාර්ය වූයේ,

i) උණබට පොතු කර්මාන්තයේ යෙදීමයි.
ii) දඩයම් කරමින් දිවි සරිකර ගැනිමයි.
iii) රිය හා සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි.
iv) අසුචි හා මළමිනි බැහැර කිරීමෙන් දිවි ගෙවීමයි.
v) කැලි කසල බැහැර කිරීමේ කටයුතු වල නිරත වීමයි.

11. බුද්ධකාලීන භාරතයෙහි නගර ශෝභිනීන් ලෙස හැඳින්වූවෝ,

i) පංච කල්‍යාණයෙන් අගතැන්පත් වූවෝ ය.
ii) අන්තඃපුර ස්ත්‍රීහු ය.
iii) ගණිකා වෘත්තියෙහි නිරත වූවෝ ය.
iv) නගර අලංකාර කළ රූමතියෝ ය.
v) යාගයෙහි නිරත වූවෝ ය.

12. ගුරුවරයා ළඟ හිඳගෙන උගත යුතු රහස් උගන්වන ආගමික දර්ශනයක් භාරතයේ ක්‍රියාත්මක විය. එම සංකල්පය ක්‍රියාවට නැංවූ යුගය හැඳින්වෙන්නේ,

i) වේද යුගය ii) අරණ්‍යක යුගය iii) ශිෂ්ටාචාර යුගය

iv) බ්‍රාහ්මණ යුගය v) උපනිශද් යුගය

13. සත්වයන්ගේ කෙළෙසීම හෝ විසුද්ධිය පිණිස හේතුඵල සම්බන්ධයක් නැත. තමන්ගේ හෝ අනුන්ගේ හෝ යහපත පිණිස කළ යුතු දෙයක් නැත. සියලු සත්වයෝ වීර්යය, බලය, ආත්ම ශක්තිය රහිත යෝ ය. මෙයින් ආගමික චින්තාව හඳුන්වන්නේ,

i) පරම අවිහිංසාවාදය වශයෙනි.
ii) අහේතු අප්‍රත්‍යයතාවාදය වශයෙනි.
iii) පුබ්බේකතහේතුවාදය වශයෙනි.
iv) උච්ඡේදවාදය වශයෙනි.
v) අමරාවික්ඛේපවාදය වශයෙනි.

Education NCP -www.edncp.lk

14. ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්පච්චයවාදය යනාදි ඉගැන්වීම්වලට සාපේක්ෂ ව බුදුසමය, හොඳ නරක තෝරා බේරාගෙන කටයුතු කිරීමට පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් ඇතැ'යි ද යම් ක්‍රියාවක් ආරම්භ කිරීමටත්, නොකඩවා පවත්වාගෙන යාමටත්, බාධා ජය ගැනීමටත් හැකියාව ඇතැ'යි ද අවධාරණය කරයි. මෙමගින් තහවුරු වන්නේ බුදුසමය,

i) පුද්ගල අනන්‍යතාව පිළිගන්නා බවයි.
ii) පුද්ගල ඒකාබද්ධතාව පිළිගන්නා බවයි.
iii) පුද්ගල සක්‍රියතාව පිළිගන්නා බවයි.
iv) පුද්ගල නිරවද්‍යතාව පිළිගන්නා බවයි.
v) පුද්ගල අර්ථ සිද්ධිය පිළිගන්නා බවයි.

15. මිනිසාගේ ශක්තිය වළකා ලන සියලු බලවේග බුදු සමයෙන් ප්‍රතික්ෂේප කෙරේ. බාහිර වශයෙන් ගැලවුම් කරුවෙකු අපේක්ෂා නොකරන බුදු සමය මිනිසාගේ ස්වාමිත්වය මිනිසාට ම පවරා තිබේ. ඒ අනුව මිනිසා අරමුණක් පෙර දැරි කරගෙන ස්වතන්ත්‍ර අධිෂ්ඨානයකින් පියවර කිහිපයක් ඔස්සේ ක්‍රියා කිරීමට හැකි අයෙක් බව ඉගැන්වෙන සූත්‍රය වන්නේ,

i) අංගුත්තර නිකායේ නිබ්බේධික සූත්‍රය යි.
ii) මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය යි.
iii) අංගුත්තර නිකායේ අත්තකාර සූත්‍රය යි.
iv) දීඝ නිකායේ මහා පරිණිබ්බාන සූත්‍රය යි.
v) මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රය යි.

16. උදක පාරිශුද්ධිය යන්නෙහි අදහස දැක්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) ජලය පානය කිරීමෙන් පාරිශුද්ධත්වයට පත්වේය යන විශ්වාසය යි.
ii) ඇල්දිය ප්‍රතික්ෂේප කිරීමෙන් පාරිශුද්ධත්වයට පත්වේය යන විශ්වාසය යි.
iii) ජලය පානය නොකිරීමෙන් පාරිශුද්ධත්වයට පත්වේය යන විශ්වාසය යි.
iv) දිනකට දෙවරක් ඉතා අළුයම හා මධ්‍යාහ්න කාලයේ දියෙහි කිමිදීමෙන් පාරිශුද්ධත්වයට පත්වේය යන විශ්වාසය යි.
v) දිනකට දෙවරක් ජලයෙහි ගිලීමෙන් පාරිශුද්ධත්වයට පත්වේය යන විශ්වාසය යි.

17. චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැක්වෙන පරිදි සමාජය තුළ හේතුඵල වශයෙන් පාපක්‍රියා සන්තතියක් වර්ධනය විය. එබඳු අපගාමී චර්යා පද්ධතියක් වෙත මිනිස් සමාජය යොමු වීමට ඉවහල් වූ ප්‍රධාන සාධකය වූයේ ,

i) රාගයයි. ii) කාමයයි. iii) අභිධ්‍යාවයි.

iv) දරිද්‍රතාවය යි. iv) සම්පත් බෙදියාමේ අක්‍රමිකතාවයි.

Education NCP - www.ednecp.lk

18. භාරතීය කාන්තාවට සවැනි සියවස තුළ බමුණු ඒකාධිකාරය යටතේ සිදු වූයේ කෙළි බඩුවක් ලෙස ජීවත් වීමටය. ඒ අනුව සියලු වරප්‍රසාද අහිමි වූ ඇය, ස්වාමියා මියගිය හොත් සති පූජාව සිදු කළ යුතු විය. සති පූජාව නම්,

i) ඉදුල් බතින් තොරව රසවත් ආහාර අනුභව කරමින් දිවි ගෙවීම.
ii) සිය වැඩිමල් පුතු යටතේ ජීවිතාන්තය තෙක් දිවි ගෙවීම.
iii) දිවි ඇති තෙක් වෙනත් පුරුෂයෙකුගේ මුහුණවත් නොබලා දිවි ගෙවීම.
iv) දිවි ඇති තෙක් වැන්දඹුවක් ලෙස දිවි ගෙවීම.
v) ස්වාමියාගේ සිරුර දැවෙන දර සෑයට පැන සියදිවි නසා ගැනීම.

19. අගනුවර වෙනස්වීමත් සමඟ "පෞර රාජ්‍ය" ක්‍රමයෙන් බිඳ වැටුණි. ප්‍රාදේශිය රජවරු එකිනෙකා තම ස්වාධීනත්වය පළ කරමින් වෙන්වන්නට පටන් ගත්හ. සොළොස් මහ ජනපද ලෙස ප්‍රසිද්ධ කුඩා රාජ්‍යයන් පහළ වුයේ එහි ප්‍රතිඵලයක් ලෙසය. මෙම රාජ්‍යයන් අතරින් " බදිරිකාරාමය, කුක්කුටාරාමය, ඝෝෂිතාරාමය, පාවාරිකාරමය" යන ආරාම පිහිටා තිබූ රාජ්‍යය වනුයේ,

i) මගධ රාජ්‍යයෙහිය. ii) කෝසල රාජ්‍යයෙහිය. iii) වත්ස රාජ්‍යයෙහිය.

iv) අවන්ති රාජ්‍යයෙහිය. v) වජ්ජි රාජ්‍යයෙහිය.

20. "සමාජ ප්‍රභවය"පිළිබඳ බ්‍රාහ්මණ චින්තනය වූ දේව නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන බුදුසමය සාමාජීක, ආර්ථික, දේශපාලනික, පාරිසරික හා මනෝමූලික ආදි විවිධ සාධක පදනම් කොටගෙන හේතුඵලවාදී ව සමාජ පරිණාමය සිදුවූ බව අග්ගඤ්ඤ සූත්‍රයේදී පෙන්වා දෙයි. ඒ අනුව රාජ්‍යයේ ප්‍රභවය සිදු වූයේ,

i) මහජන උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වශයෙනි.
ii) පාරම්පරික උරුමයේ හිමිකම අනුවය.
iii) මහජන සම්මුතියේ ප්‍රතිඵලයක් වශයෙනි.
iv) කර්ම විපාක සිද්ධාන්තයේ ප්‍රතිඵලයක් වශයෙනි.
v) දේව නිර්මාණවාදය ප්‍රතික්ෂේප කිරීමෙනි.

21. ඊශ්වර නිර්මාණවාදි සංකල්පය යටතේ ඉදිරිපත් කර ඇති තවත් විශේෂ ඉගැන්වීමක් නම් "ත්‍රිමූර්ති" සංකල්පය යි. එයට අයත් වන්නේ,

i) බ්‍රහ්ම, විෂ්ණු, මහේෂ්වර දෙවිවරුය.
ii) චන්ද්‍ර, සූර්ය, අග්නි දෙවිවරුය.
iii) මරුත්, පර්ජන්‍යා, මේඝ දෙවිවරුය.
iv) විජ්ජු, අග්නි, මරුත් දෙවිවරුය.
v) අශ්වින්, රුද්‍ර, ඌෂා දෙවිවරුය.

22. "සක්විති රාජ්‍යය"යනු පියාගෙන් පුතුට උරුම වන දායාදයක් නොවන බව චක්කවත්තිසීහනාද සූත්‍රය අවධාරණය කරයි. බෞද්ධ ඉගැන්වීම් අනුව චක්‍රවර්ති රාජ්‍යය නම් පරමාදර්ශි පාලනතන්ත්‍රයක් වන අතර චක්‍ර රත්නය තුලින් එය ගම්‍ය කෙරේ.එවන් පාලනයක් බිහිකරගත හැක්කේ,

i) ආචාර ධර්මීය වශයෙන් පාලකයා සුදුසුකම් සපුරා ගැනීමෙනි.
ii) පුරෝහිත බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීමෙනි.
iii) ගම් දනව් වැසියන්ට ධාර්මික රැකවරණය සැළසීමෙනි.
iv) අධාර්මික ක්‍රියා කරන අපරාධකරුවන් මුලිනුපුටා දැමීමෙනි.
v) දිළිදු ජනයාට ධනය ලබාදීම තුළිනි.

Education NCP - www.edncp.lk

23. "සෑම සාර්ථක වූ මිනිසකු පිටුපසම ගැහැනියක් සිටී" යන කියමන ඉතා ප්‍රකට වූවකි. ඒ අනුව සැමියාගේ යම් යම් අඩුපාඩු තිබුනද ඒවා මග හරවාගෙන ඉක්මනින් කෝපයට පත් නොවී, බුද්ධිමත්ව,දුරාචාරයට යොමු නොවී, කටයුතු කිරීම තුළ පවුල් සංස්ථාව ආරක්ෂාවේ.එසේ බිරින්දෑවරු සත් දෙනෙකු පිළිබඳව "සප්තභරියා" සූත්‍රයේ සඳහන් වන අතර එහිදී යහපත් බිරිඳක් වන්නේ,

i) චෝර භාර්යාව. ii) භගිනි භාර්යාව. iii) වධක භාර්යාව.

iv) ස්වාමි භාර්යාව. v) අධිපති භාර්යාව.

24.වාචසික සංවරය බුදුසමය බෙහෙවින් අගය කරයි. යහපත් වචන භාවිතය උභයාර්ථය පිණිසම හේතුවේ. නිර්වාණාවබෝධය උදෙසා ද එය අවශ්‍යවන අතර සම්මා වාචා ලෙස ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දක්වා තිබේ. සච්චවිභංග සූත්‍රයේ දැක්වෙන පරිදි වාචසි සංවරය සතරාකාර වේ. එයට අයත් අංගයක් වන්නේ,

i) අභිධ්‍යාවෙන් වෙන්වීම.
ii) පේසුඤ්ඤයෙන් වෙන්වීම.
iii) ව්‍යාපාදයෙන් වෙන්වීම.
iv) මිච්ඡා ආජීවයෙන් වෙන්වීම.
v) පටිඝයෙන් වෙන්වීම.

25. පුද්ගලයාගේ ස්වාධීනත්වය,ස්වච්ඡන්දතාව හා වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) චේතනාව කර්මයවේ යන්නයි.
ii) තමාට පිහිට තමා මය අන් කිසි පිහිටක් නැත යන්නයි.
iii) සරු දේ සරු ලෙසත්, නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතුය යන්නයි.
iv) තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නො කළ යුතුය යන්නයි.
v) පව් කරන්නා දෙලොවම තැවෙයි යන්නයි.

26. බුදු දහම ලෝකෝත්තර මාර්ගය මූලික කරගෙන දහම් දෙසන ආගමක් වුවද ලෞකික ක්ෂේත්‍රය කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට ඇත. ඒ අනුව බුදුරදුන් දේශපාලන ක්ෂේත්‍රය තුළ අගය කළ පරමාදර්ශි පාලකයා වූයේ,

i) උදේනි රජු ය. ii) කොසොල් රජු ය. iii) සක්විති රජුය.

iv) බිම්බිසාර රජුය. v) අජාසත්ත රජු ය.

27. අග්ගඤ්ඤ සූත්‍රයට අනුව ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පැමිණි "සත්තා" නම් කණ්ඩායමේ ශරීරයෙන් නිකුත් වූ ප්‍රභව නැතිව යාමට හේතුව වූයේ,

i) රස පොළොවේ ඇලි ගැලීම.
ii) ස්වයංජාත හැල් ලෝලත්වයෙන් අනුභවය.
iii) බදාලතා වැල් ලෝලත්වයෙන් අනුභවය.
iv) බිම්හතු ලෝලත්වයෙන් අනුභවය.
v) කෙත් වතුවලට වැට කඩොලු දමා ගැනිම.

Education NCP - www.edncp.lk

28. බුද්ධකාලීන භාරතයේ පැවති පාලන තන්ත්‍ර පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) කොසඹෑව අගනගරය කරගත් වත්ස රාජ්‍යය රාජාණ්ඩුවක් නොවේය යන්නයි.
ii) කුසිනාරාව අගනගරය කරගත් මල්ල රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි යන්නයි.
iii) රජගහ නුවර අගනගරය කරගත් මගධ රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි යන්නයි.
iv) සාවත්තිය අගනගරය කරගත් කොසොල් රාජ්‍යය කුඩා රාජ්‍යයකි යන්නයි.
v) වෛශාලිය අගනගරය කරගත් වජ්ජි රාජ්‍ය ප්‍රබල රාජාණ්ඩුවකි යන්නයි.

29. භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යනු බුදු සසුනෙහි දැක්වෙන චතුර්විධ ශ්‍රාවක පිරිසයි. ගිහි පැවිදි දෙපාර්ශවයේ ම බුදුරදුන්ගේ ශ්‍රාවකයෝ සිටිති. ආර්ය ශ්‍රාවක යනුවෙන් හැඳින්වෙන්නේ ද විශේෂිත වූ බුද්ධ ශ්‍රාවක පිරිසකි. බෞද්ධ ඉගැන්වීම් අනුව ආර්ය ශ්‍රාවකයෝ,

i) බුදුන් වහන්සේගෙන් පමණක් ම ධර්මය ඇසූ ශ්‍රාවකයන් අතර සිටිය හැකිය.
ii) රහත්ඵලයට පත් ශ්‍රාවකයන් අතර පමණක් සිටිය හැකිය.
iii) භික්ෂු භික්ෂුණී අතර පමණක් සිටිය හැකිය.
iv) උපාසක උපාසිකා අතර පමණක් සිටිය හැකිය.
v) සිව්වණක් පිරිසෙහි ම සිටිය හැක.

30. "රටවැසියන්ගේ ආරක්ෂාව හා රැකවරණය පමණක් නොව ආර්ථික සංවර්ධනය තුළින් රටේ ස්ථාවරභාවය ඇති කර ගැනීමත්, රටේ අපරාධ මර්දනයත්, සාමය හා සංහිඳියාවත්,රාජ්‍යයක සංවර්ධන ඉලක්ක ජය ගැනිමට සෘජුව ම බලපායි. එසේම පාලකයා අත්තනෝමතික, අගතිගාමී තීරණ ගැනීමෙන් රටට සිදුවන හානිය වලක්වා ගැනීමට මදයෙන් හා ප්‍රමාදයෙන් තොර පූජනීය විශාරදයන්ගේ අවවාද අනුශාසනා ලබා ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම් කළ යුතුය." මෙම ඡේදයේ අන්තර්ගත බෞද්ධ දේශපාලන මූලධර්මය ලෙස හඳුනාගත හැක්කේ,

i) පංචසීල ප්‍රතිපදාවයි.
ii) සප්ත අපරිහානීය ධර්මය යි.
iii) දසරාජ ධර්මයයි.
iv) දස සක්විති වතයි.
v) සතර අගතියෙන් තොර වීමයි.

31. සිඟාලක ගෘහපති පුත්‍රයා විසින් අනුගමනය කරනු ලැබූ පිළිවෙතක් දුටු බුදුරදුන් ඒ වෙනුවට සමාජගත ජීවිතයේදී පුද්ගලයා විසින් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් සමුදායක් පෙන්වා දී ඇත. සමාජයේ යහපැවැත්මට හේතුවන එකී යුතුකම් අතුරෙන් "ගිලන් වූ විට උපස්ථාන කිරීම"

i) බිරිඳගේ වගකීමකි.
ii) දෙමාපියන්ගේ වගකීමකි.
iii) දරුවන්ගේ වගකීමකි.
iv) සේව්‍යයාගේ වගකීමකි.
v) ගුරුවරයාගේ වගකීමකි.

Education NCP - www.edncp.lk

32. පැවිදි සාමණේර භික්ෂූන් උදෙසා සාමණේර දස සීලයද, උපසම්පදා භික්ෂූන් උදෙසා උපසම්පදා සීලය ද විශේෂිතය. සෑම භික්ෂුවක් ම සතර සංවර සීලයෙන් යුක්ත විය යුතුය. ඒ අනුව සතර සංවර සීල ප්‍රතිපදාවෙහි ඇතුළත් "ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය" යන්නෙන් අර්ථවත් වන්නේ,

i) ඇස,කණ,නාසය දිව හා ශරීරය යන පසිඳුරන් සංවර කරගැනීමයි.
ii) සිව්පසය සිහි බුද්ධියෙන් පරිහරණය කිරීමයි.
iii) ප්‍රාතිමෝක්ෂයෙහි උගන්වන ශික්ෂාවන් අනුව දිවි පෙවත සකසා ගැනීමයි.
iv) සිව්පසය සිහි බුද්ධියෙන් පරිහරණය නොකිරීමයි.
v) භික්ෂුවකට නොගැලපෙන ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමයි.

33. ක්‍රිස්තු පූර්වභයවන සියවසේ ආර්ථිකයේ නව ප්‍රවණතාව වූයේ,

i) භාණ්ඩ හුවමාරු ආර්ථිකය ය.
ii) නව කෘෂිභෝග හඳුන්වා දීමය.
iii) කාර්මික හා වාණිජ ප්‍රබෝධයකි.
iv) ධනවාදය අභියෝගයකට ලක් වීමය.
v) කෘෂිකාර්මික ජීවන රටාව බිඳ වැටීමය.

34. නිර්වාණාවබෝධය සඳහා මග පෙන්වීම බුදු සමයේ කේන්ද්‍රීය භරය වුවද පුද්ගලයාගේ ලෞකික ජීවිතය මෙන් ම ඒ හා බැඳුන කාර්යයන් කිසි විටෙකත් අමතක කර නොමැත. නිකාය සාහිත්‍යාගත කරුණු විමර්ශනය කර බැලීමෙදී ලෞකික විෂයක් වූ සෞන්දර්ය හා රසවින්දනය පිළිබඳ බෞද්ධ ආකල්පය කෙබඳුදැයි මනාව තේරුම් ගත හැකිය. ඒ අනුව ථේර ගාථාවල එන "නදිය අජකරණී චේය මට හරි රමණී" යන භාව ගීතය ඇතුලත් වන්නේ,

i) රට්ඨපාල තෙරුණුවන් විසින් ප්‍රකාශිත ථේර ගී වල ය.
ii) කාලුදායි තෙරුණුවන් විසින් ප්‍රකාශිත ථේර ගී වල ය.
iii) වනවච්ඡ තෙරණුවන් විසින් ප්‍රකාශිත ථේර ගී වල ය.
iv) මහා කාශයප තෙරණුවන් විසින් ප්‍රකාශිත ථේර ගී වල ය.
v) සප්පක තෙරණුවන් විසින් ප්‍රකාශිත ථේර ගී වල ය.

35. බුදු සමය තුළ "දානය" විශේෂයෙන් වර්ණනා කර ඇත. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතර පලමුවැන්න දානයයි. දස පාරමිතා අතර පළමුවන පාරමිතාව දාන පාරමිතාවයි. දස රාජ ධර්ම අතර ද සතර සංග්‍රහ වස්තු අතර ද පලමු වැන්න දානයයි. ඒ අනුව සියලු දානයන් අතුරින් උතුම්ම දානය වන්නේ,

i)ආමිස දානය
ii) ධර්ම දානය
iii) අභය දානය
iv) ජීව දානය
v) සාංඝික දානය

36. ලෞකික ජීවිතයේදී මිනිසාට ධනය ඉපයීම අවශ්‍ය බව බුදු දහම පිළිගන්නා කාරණයකි. එසේ ඉපයූ ධනය ආත්මාර්ථය පමණක්ම නො සිතා තමා උපමාවට ගෙන අන් අය ගැන ද සිතා පරිභෝජනය කළ යුතුය. ඒ අනුව අංගුත්තර නිකායේ දැක්වෙන පංචබලි සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් ධන පරිභෝජනය තවදුරටත් අර්ථවත් කර ගත හැකිය. එම පංචබලි සූත්‍රයේ සඳහන් "අතිථි බලි"යනු,

i) මිය ගිය අය වෙනුවෙන් පිං පෙත් දීම් වශයෙන් කරන සංග්‍රහයන් ය.
ii) ඥාතීන් සඳහා කරන සංග්‍රහයන් ය.
iii) දෙවියන් වෙනුවෙන් පිං දීම පුද පූජා පැවැත්වීම වශයෙන් කරන සංග්‍රහයන් ය.
iv) රජයට ලබා දිය යුතු බදු ගෙවීමය.
v) ආගන්තුකයන් සඳහා කරන සංග්‍රහයන් ය.

Education NCP - www.edncp.lk

37. ගෘහස්ථ ප්‍රතිපදාවට අදාළ බෞද්ධ මුලාශ්‍රය අනුව ස්ත්‍රීධූර්ත නොවීම. සුරාධූර්ත නොවීම, අවේලාවේ වීදී සංචාරය නොකිරීම, කළ්‍යාණ මිත්‍රයන්ට අවනත වීම යන සිවු වැදැරුම් කරුණු සෘජු ලෙස පුද්ගලයාගේ,

i) ආධ්‍යාත්මික සංවර්ධනයට හේතු වේ.
ii) නිර්වාණගාමී ප්‍රතිපදාවට හේතු වේ.
iii) ආර්ථික සංවර්ධනයට හේතු වේ.
iv) පරලොව දියුණුවට හේතු වේ.
v) පරාර්ථ චර්යාවට හේතු වේ.

38. "අණන" සුත්‍රයේ විස්තර වන චතුර්විධ සුඛයන් අතර "අනවජ්ජ සුඛය" යනුවෙන් අදහස් කරනුයේ,

i) තමා සතු සම්පත් නිසි පරිදි පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.
ii) සිත,කය,වචනය යන තිදොරින් කිසිවකුට මාගෙන් වරදක් සිදුවී නැතැයි සිතීමෙන් ලබන සතුටයි.
iii) දැහැමිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුටයි.
iv) මට ධනය ඇතැයි හැඟීම නිසා ඇතිවන සතුටයි.
v) භව භෝග සම්පත් බහුලව රැස් කර ගැනීමෙන් ලබන සතුටයි.

39. "මේ දහම් අකුසල් ය. මේ දහම් වරද සහිත ය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ දහම් පිළිපැදීමෙන්, සමාදන් විමෙන්,අවැඩ පිණිස,දුක් පිණිස පවත්නාහ'යි යම් කලෙක ඔබ ඔබම දැනගන්නාහු නම් එය දුරු කරව්" යනුවෙන් දැක්වෙන බුද්ධ දේශනාවෙන් අවධාරණය කරන්නේ,

i) බුදු දහම අත්තනෝමතික පුද්ගල චින්තනය උසස් යැයි අගය කළ බවයි.
ii) බුදු දහම කිසිවෙකුට අවැඩ පිණිස, දුක් පිණිස හේතු නොවන දේ කිරීම අගය කළ බවයි.
iii) බුදු දහම නිදහස් චින්තනය අගය කළ බවයි.
iv) බුදු දහම නුවණැත්තන් විසින් ගරහන ලද දේ අගය කළ බවයි.
v) බුදු දහම කාලාම සුත්‍රගත ' කුසල් ' පමණක් අගය කළ බවයි.

40. ශ්‍රද්ධාව භක්තිය සමාන පද දෙකක් ලෙසින් පෙනුන ද, එහි අර්ථය සම්පුර්ණයෙන් ම එකිනෙකට වෙනස් ය. භක්තිය යනු සත්‍ය ගවේෂණයකින් තොරව විශ්වාස කිරීම, ඇදහීම, පිළිගැනිම යනාදි අර්ථ ගම්‍යමානවන පදයකි. එහෙත් ශ්‍රද්ධාව යන පදයෙන් ඊට වඩා ගැඹුරු අර්ථයක් ගෙන දෙයි. බුදු දහමෙහි ශ්‍රද්ධාව,අමුලික සද්ධා සහ ආකාරවති සද්ධා යනුවෙන් දෙපරිදිව දැක්වේ. ශ්‍රද්ධාව උපදවා ගැනීම නිර්වාණගාමී ප්‍රතිපදාවේ මුලික පියවර ලෙස ද , සසරින් එතෙරවීම සඳහා පදනමක් වන බවද අධ්‍යාත්මික කෙතෙහි වපුරන බිජුවට ලෙස ද දක්වා තිබිමෙන් බුදු සමය ශ්‍රද්ධාව අගයකොට ඇති ආකාරය පැහැදිලි වෙයි. මෙහිලා බුදුසමය ඇගයීමට ලක් කරනු ලබන්නේ,

i) අමුලිකා ශ්‍රද්ධාව හා ආකාරවති ශ්‍රද්ධාව මිශ්‍ර වු භක්තිය යි.
ii) භක්තිය හා මිශ්‍ර වු ශ්‍රද්ධාවයි.
iii) භක්තිය හා මිශ්‍ර වු අමුලිකා ශ්‍රද්ධාවයි.
iv)සකාරණ වු ආකාරවති ශ්‍රද්ධාවයි.
v) භක්තිය හා මිශ්‍ර වු ආකාරවති ශ්‍රද්ධාවයි.

41. බ්‍රාහ්මණ සංස්කෘතියේ පදනම වු වර්ණභේද සෘජුව ප්‍රතික්ෂේප කෙරෙන සුත්‍රයකි,

i) පරාභව සුත්‍රය. ii) ආදිත්තපරියාය සුත්‍රය. iii) අරියපරියේසන සුත්‍රය.

iv) ව්‍යග්ඝපජ්ජ සුත්‍රය v) මධුර සුත්‍රය.

Education NCP - www.edncp.lk

42. හොඳ - නරක ක්‍රියා විනිශ්චය කිරීමේ මිණුම් දඬු ඇතැම් විට ඒ ඒ ආගම්වල වෙනස්ය. එක් ආගමක හොඳ ක්‍රියාවක් වෙනත් ආගමක හොඳ නොවන ක්‍රියාවක් විය හැකිය. එහෙත් හොඳ - නරක ක්‍රියා තිරණය කිරීමේ බෞද්ධ නිර්ණායක ලෝකයේ යථාර්ථයට අනුරූප වේ. මෙය සිද්ධිවාචක බව යනුවෙන් ද හැඳින්වේ. මේ අනුව "පව් කරන පුද්ගලයාට තමා විසින් සිදු කළ පාපය පිළිබඳ රහසක් නැත. තමා කළ ක්‍රියා පිළබඳව ඔහු පවසන දේ සත්‍යයක්ද, අසත්‍යයක් දැයි ඔහුම දනියි" මෙම ප්‍රකාශයෙන් අවධාරණය කෙරෙන හොඳ - නරක විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායකය වන්නේ,

i) ආත්මාර්ථයට හේතු නොවුන ද පරාර්ථය පිණිස හේතු වන ක්‍රියා කිරීමයි.
ii) හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කිරීමයි.
iii) සිද්ධි වාචික වු ක්‍රියා සිදු කිරීමයි.
iv) ඕනෑම ආගමක් පිළිගතහොත් හොඳයැ'යි සම්මත ක්‍රියා කිරීමයි.
v) නුවණැත්තන්ගෙන් විමසා හොඳ නරක තීරණය කිරීමයි.

43. තුදුස් ලාමක ධර්මයන් අන්තර්ගතවන සූත්‍රය වන්නේ,

i) මහා පරිණිබ්බාණ සූත්‍රයයි.
ii) පරාභව සූත්‍රයයි.
iii) අරියපරියේෂණ සූත්‍රයයි.
iv) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
v) සිඟාලෝවාද සූත්‍රයයි.

44. ගෘහස්ථ ජීවිතය තුළ ඇතමෙක් සදාචාරාත්මක සීමාව අතික්‍රමණය කරමින් ඉන්ද්‍රියන් පිනවීමට ප්‍රයත්න දරයි.එසේ සදාචාරාත්මක සීමාව ඉක්මවා කම්සැප නොවිඳිය යුතු බව උගන්වන ශික්ෂාපදය වන්නේ,

i) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණි සික්ඛා පදං සමාදියාමි.
ii) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි.
iii) පරුෂාවාචා වේරමණි සික්ඛා පදං සමාදියාමි.
iv) අදින්නාදානා වේරමණි සික්ඛා පදං සමාදියාමි.
v) කාමේසුමිච්ඡාචාරා වේරමණි සික්ඛා පදං සමාදියාමි.

45."පංචසිඛ" නම් ගාන්ධර්වයා බුදුරදුන් වෙත පැමිණ බේලුව පණ්ඩු වීණාව වාදනය කරමින් සිය පෙම්වතිය වෙනුවෙන් ප්‍රබන්ධිත ගී පෙළක් ගායනා කළේය. මෙහිදී බුදුරාජාණන් වහන්සේ පංචසිඛගේ ගායන,වාදන දක්ෂතාව ඇගයීමට ලක් කළහ.මේ සිද්ධිය සඳහන් වන්නේ,

i) මහා මංගල සූත්‍රයේ ය.
ii) සක්කපඤ්හ සූත්‍රයේ ය.
iii) සිඟාලෝවාද සූත්‍රයේ ය.
iv) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
v) මහා පරිණිබ්බාණ සූත්‍රයේ ය.

46. මිනිස් වෙසින්, මිතුරු වෙසින් සැබෑ මිත්‍රයෙකු ලෙස පෙනී සිටිමින් කටයුතු කරන, එසේම "චිත්ත ප්‍රිය වචනම කතා කළද, ක්‍රියාවෙන් කිසිදු උදව්වක් නොකරන මිත්‍රයා" හඳුන්වන්නේ,

i) අඤ්ඤදත්ථුහර නමිනි.
ii) වචීපරම නමිනි.
iii) අනුප්පියභාණි නමිනි.
iv) අපායසහාය නමිනි.
v) අත්ථක්ඛායි නමිනි.

Education NCP - www.edncp.lk

47. භික්ෂු භික්ෂුණීන්ගේ ශරීර කෘත්‍ය පහසුවෙන් සිදුකර ගැනීම සඳහා වැසිකිලි, කැසිකිලි අනුදත් බුදුරදුන් ඊට අදාළ ඇවතුම් පැවතුම් රැසක් ද වච්චකුටිවත මගින් අනුදත් සේක. හරිත තණබිම්වල මෙන්ම ජලයේ ද මළමුත්‍රා නොකළ යුතුය. යනුවෙන් තවත් එක් විනය නීතියක් පැනවීම මගින් ප්‍රකට වන්නේ බුදුරදුන්,

i) මහජන හඬට කන්දුන් බවයි.
ii) පරිසර සංරක්ෂණය පිළිබඳ සැළකිලිමත් වූ බවයි.
iii) භික්ෂූන්ගේ විනය පිළිබඳ අවධානයෙන් සිටි බවයි.
iv) අන්‍යාගමික අදහස් වලට ගරු කළ බවයි.
v) භික්ෂූන්ගේ ශරීර කෘත්‍ය පිළිබඳ සැළකිල්මත් වූ බවයි.

48. කළමනාකරණය පිළිබඳ විවිධ නිර්වචන දක්නට ලැබේ. පොදු වශයෙන් කිසියම් සංවිධානයක හෝ පුද්ගලයෙකුගේ හෝ ඵලදායීතාවය වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් 'කළමනාකරණය' යන්නෙන් අදහස් වෙයි. මෙකී අරුතින් බෞද්ධ සංදර්භය තුළ ද 'කළමනාකරණය' යන්න භාවිතාවන බව දැකිය හැකිය. භෞතික සම්පත් හා මානව සම්පත් කළමනාකාරිත්වයක් ලෙස අවධාරණය කොට ඇත්තේ,

i) කාල කළමනාකරණය යි.
ii) නිෂ්පාදන කළමනාකරණය යි.
iii) පිරිස් කළමනාකරණය යි.
iv) ආධ්‍යාත්මික කළමනාකරණය යි.
v) සම්පත් කළමනාකරණය යි.

49. අට්ටික්කා ගහේ මල් පිපීම, සුදු කපුටන් සිටීම, මසුන්ගේ පා සටහන් ජලයේ තිබීම යනාදිය අභව්‍ය සිදුවීම්ය. එම සිදුවීම් සිදු වුවද ස්ත්‍රියගේ සිත කිසිවිටකත් විශ්වාස නොකළ යුතුය යන්න දැක්වෙන්නේ,

i) දර්ශනංචිත්ත වෛකල්‍යං.................
ii) ඖදුම්බරං භවං පුෂ්පං.................
iii) මුඛ පද්ම දළාකාරං.................
iv) ස්ථානං නාස්ති ක්‍ෂණං නාස්ති.................
v) බාලෙය පිතුර්වගේ තිෂ්යේත්.................

50. කෝටි ගණන් මුදල් වැය කරමින් බුදු සසුනට මහත් සේවාවක් කළ සිටුවරු එදා භාරතයේ විසූහ. ඉඩමක කහවනු අතුරා එම මිලට ජේතවනාරාමය ඉදි කර බුදුරදුන්ට පූජා කරන ලද්දේ,

i) අනේපිඬු සිටුතුමා ය.
ii) බරණැස් සිටුතුමා ය.
iii) ධනංජය සිටුතුමා ය.
iv) මිගාර සිටුතුමා ය.
v) සෝසිත සිටුතුමා ය.

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# අවසාන වාර පරීක්ෂණය - 2017

ශ්‍රේණිය 12

විෂය බෞද්ධ ශිෂ්ටාචාරය -II

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................

....................................................  කාලය : පැය 3 යි.

Education NCP - www.edncp.lk

❖ **I කොටසින් ප්‍රශ්න දෙකක් හා II කොටසින් ප්‍රශ්න තුනක්ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. i) බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව වෛශ්‍ය වර්ණයට නියමිත 'ස්වධර්ම' නම් කරන්න.

ii) වෛදික සාහිත්‍යයේ දැක්වෙන 'ආශ්‍රමධර්ම' හඳුන්වා දෙන්න.

iii) වෛදික සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පහක් නම් කරන්න.

iv) කාන්තාව සිය ජීවිත කාලය ම පිරිමි පක්ෂය යටතේ ජීවත්විය යුතුයැ'යි දැක් වූ බ්‍රාහ්මණ නිගමනය ගෙනහැර දක්වන්න.

v) බුදු සමයෙන් කාන්තාවට හිමිකර දුන් ආගමික ස්වාධීනත්වය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න.

02. i) බුද්ධ කාලීන සමාජයේ විද්‍යමාන වූ නාගරීකරණ හා වාණිජ්‍යකරණ ප්‍රවණතා හඳුන්වා දෙන්න.

ii) ක්‍රි.පූ.6 වන සියවසේ කෘෂි ආර්ථිකයේ ප්‍රවණතා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii) මානව වර්ගයාගේ ඒකත්වය ජීව විද්‍යානුකූලව බුද්ධ වචනානුසාරයෙන් සනාථ කරන්න.

iv) ශ්‍රමණ සම්ප්‍රදාය හා බ්‍රාහ්මණ සම්ප්‍රදාය අතර ඇති වෙනස්කම් පහදන්න.

v) සදිසා සංකල්පයෙන් ඉදිරිපත් වන මා පිය - දූ දරු සම්බන්ධය විවරණය කරන්න.

03. i) නිගණ්ඨනාථ පුත්තයන්ගේ ජීවන තොරතුරු සැකෙවින් දක්වන්න.

ii) බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරදුන් අතර පැවති සම්බන්ධතා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

iii) ගිහි බෞද්ධයාට ආර්යශ්‍රාවකයකු වීමට බාධවක් නැත" විමසන්න.

iv) සමාජ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ මතය පැහැදිලි කරන්න.

v) දැහැමි බෞද්ධ රජකු විසින් අනුගමනය කළයුතු දස සක්විතිවත් නම් කරන්න.

**II කොටස**

04. i) සප්ත අපරිහානීය ධර්ම යනු රටක දේශපාලන යහ පැවැත්මට උපයෝගී වන අගනා ඉගැන්වීමකි. විමසන්න.

ii) ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් විමර්ශනය කරන්න.

iii) අජිත කේසම්බලීගේ දර්ශනය සමාජ විරෝධි ඉගැන්වීමක් බව ප්‍රකට කරන්න.

iv) නූතන සමාජ ගැටලු අවමකර ගැනීම උදෙසා පංචසීල ප්‍රතිපදාව උපයෝගී කරගත හැකි ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

05. i) "අගහිඟකම මිනිසා අපරාධවලට පොළඹවයි" සාකච්ඡා කරන්න.

ii) විරාගි සෞන්දර්ය රසාස්වාදය බුදුදහමේ අගය කොට ඇති ආකාරය දක්වන්න.

iii) ආර්ථික සමෘද්ධිය සමග බුද්ධකාලීන නාගරික සමාජය තුළ පරාභව ලක්ෂණ ද ඉස්මතු වූ අයුරු ප්‍රකට කරන්න.

iv) "බුදුරදුන් ශ්‍රේෂ්ඨ පරිසර වේදියෙකි " අජීවි පරිසරය විෂයෙහි උන්වහන්සේ දැක් වූ ආකල්පය නිදසුන් සහිතව ගෙනහැර දක්වන්න.

06. i) යාගය වෙනුවට බුදුරදුන් අනුදත් ක්‍රියා පිළිවෙත් හඳුන්වා දෙන්න.

ii) චින්තනමය, විමංසනමය නිදහස බුදුරදුන් අගය කල අයුරු බෞද්ධ මූලාශ්‍රයන් ඇසුරෙන් පහදන්න.

iii) ප්‍රාග් වෛදික සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය කෙබඳු වී දැයි පරීක්ෂා කරන්න.

iv) ෂට් ශාස්තෘවරුන් හා ඔවුන්ගේ දර්ශනයන් නම් වශයෙන් දක්වන්න.

Education NCP - www.edncp.lk

07. i) බුදු සමය තුළ අමූලිකා ශ්‍රද්ධාවට හිමි තැන පහදන්න.

ii) සේවා ආයතනයන්හි පැන නගින අර්බුද මග හැරවීම සඳහා සිගාලෝවාද සූත්‍රය ඉවහල් කර ගත හැකි ආකාරය පරීක්ෂාවට ලක් කරන්න.

iii) වෙළඳාම ධාර්මික ජීවනෝපායක් වන්නේ කෙසේදැයි බෞද්ධ නිර්ණායක වලට අනුව විවරණය කරන්න.

iv) බුද්ධ කාලීන භාරතයේ පැවති රාජාණ්ඩු 4 නම් කර ඉන් එක් රාජ්‍යයක් කෙටියෙන් හඳුන්වා දෙන්න.

08. i) "අල්පේච්ඡතාව" සාමකාමී හා තෘප්තිමත් ජීවිතයක් ගොඩනගා ගැනීමට අදාළ වන්නේ කෙසේ දැ'යි විමසිමක් කරන්න.

ii) ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස කෙටියෙන් දක්වා ඇගයීමට ලක් වන්නේ කවරාකාරයේ ශ්‍රද්ධාවක්දැ'යි පෙන්වා දෙන්න.

iii) හොඳ නරක විනිශ්චය පිළිබඳ බෞද්ධ නිර්ණායක සර්වකාලීන වටිනාකමකින් යුක්ත වන අයුරු පෙන්වා දෙන්න.

iv) භික්ෂු සංඝ හා ශ්‍රාවක සංඝ අතර වෙනස පැහැදිලි කරන්න.

Education NCP - www.edncp.lk